# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1951/9 - 2016 ජනවාරි මස 25 වැනි සඳුදා - 2016.01.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංක* : KOLDS/LND/05/ACQ/46.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4/3/9/2012/WS/72.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත සඳහන් පළමුවැනි උපලේඛනයේ හා දෙවැනි උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩම්වල විස්තර :*

**පළමුවැනි උපලේඛනය**

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ කොළොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොළොන්න කෝරළේ සුළු කොට්ඨාසයේ, අංක 205බී, මඩුවන්වෙල පැරණිගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, ඇළ ඉහළ ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් 2014.12.01 දිනැතිව මැන සකස් කරන ලද, අවසාන ගම් පිඹුරු අංක 903, අතිරේක අංක 3, පත්‍ර අංක 3 දරන පිඹුරේ කැබලි අංක 221, 222, 223 හා 225 වශයෙන් දැක්වෙන ''කොව්වි මිරිස් හේන'' නමැති ඉඩමෙන්, මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0753ක් පමණ වන පහත මායිම් තුළ පිහිටි ඉඩම් කොටස් හතර:

කැබලි අංක 221
**ඉඩමේ නම: කොව්වි මිරිස් හේන; හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: එම්. කරුණාරත්න මහතා, මඩුවන්වෙල, කොළොන්න; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0012**

*මායිම්* :
*උතුරට*: අවසාන ගම් පිඹුරු අංක 883 මඩුවන්වෙල (කොටසක්) සහ කැබලි අංක 92; *නැගෙනහිරට*: කැබලි අංක 92 සහ 222; *දකුණට*: කැබලි අංක 222 සහ අවසාන ගම් පිඹුරු අංක 883, මඩුවන්වෙල (කොටසක්); *බටහිරට*: අවසාන ගම් පිඹුරු අංක 883, මඩුවන්වෙල (කොටසක්).

කැබලි අංක 222
**ඉඩමේ නම: කොව්වි මිරිස් හේන; හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: එම්. කරුණාරත්න මහතා, මඩුවන්වෙල, කොළොන්න; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0003**

*මායිම්* :
*උතුරට*: කොළොන්න-ඇඹිලිපිටිය ප්‍රධාන මාර්ගය; *නැගෙනහිරට*: කැබලි අංක 221; *දකුණට*: අවසාන ගම් පිඹුරු අංක 883, මඩුවන්වෙල (කොටසක්); *බටහිරට*: අවසාන ගම් පිඹුරු අංක 883, මඩුවන්වෙල (කොටසක්).

කැබලි අංක 223
**ඉඩමේ නම: කොව්වි මිරිස් හේන; හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: එම්. කරුණාරත්න මහතා, මඩුවන්වෙල, කොළොන්න; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0003**

*මායිම්* :
*උතුරට*: කැබලි අංක 222 සහ 92; *නැගෙනහිරට*: කැබලි අංක 92 සහ 170; *දකුණට*: කැබලි අංක 170 සහ අ. ග. පි. 883, මඩුවන්වෙල (කොටසක්); *බටහිරට*: අවසාන ගම් පිඹුරු අංක 883, මඩුවන්වෙල (කොටසක්) සහ කැබලි අංක 222.

**කැබලි අංක 225**

**ඉඩමේ නම: කොච්චි මිරිස් හේන; හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: කේ. ගුණපාල මහතා, මඩුවන්වෙල, කොළොන්න; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0735**

*මායිම්* :

*උතුරට*: කැබලි අංක 226 සහ 124; *නැගෙනහිරට*: කැබලි අංක 124 සහ 226; *දකුණට*: කැබලි අංක 226; *බටහිරට*: කැබලි අංක 226.

**දෙවැනි උපලේඛනය**

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ කොළොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොළොන්න කෝරළේ සුළු කොට්ඨාසයේ, අංක 205බී, මඩුවන්වෙල පැරණිගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, මඩුවන්වෙල (කොටසක්) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් 2014.07.02 දිනැතිව මැන සකස් කරන ලද, ගම් පිඹුරු අංක 883, අතිරේක අංක 17, පත්‍ර අංක 23 දරන පිඹුරේ කැබලි අංක 549, 550 හා 551 වශයෙන් දැක්වෙන, මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0499ක් පමණ වන පහත මායිම් තුළ පිහිටි ඉඩම් කොටස් තුන

**කැබලි අංක 549**

**ඉඩමේ නම: —; හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: කේ. ගුණපාල මහතා, මඩුවන්වෙල, කොළොන්න; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0365**

*මායිම්* :

*උතුරට*: අවසාන ගම් පිඹුරු අංක 903 ඇළ ඉහළ ගම; *නැගෙනහිරට*: ගම් පිඹුරු අංක 883හි කැබලි අංක 105; *දකුණට*: අවසාන ගම් පිඹුරු 903 ඇළ ඉහළ ගම; *බටහිරට*: ගම් පිඹුරු අංක 883හි කැබලි අංක 105.

**කැබලි අංක 550**

**ඉඩමේ නම: —; හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: කේ. ගුණපාල මහතා, මඩුවන්වෙල, කොළොන්න; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0054**

*මායිම්* :

*උතුරට*: මෙම පිඹුරේ කැබලි අංක 549; *නැගෙනහිරට*: ගම් පිඹුරු අංක 883හි කැබලි අංක 105; *දකුණට*: අවසාන ගම් පිඹුරු අංක 903 ඇළ ඉහල ගම; *බටහිරට*: මෙම පිඹුරේ කැබලි අංක 549.

**කැබලි අංක 551**

**ඉඩමේ නම: —; හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: එම්. කරුණාරත්න මහතා, මඩුවන්වෙල, කොළොන්න; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0080**

*මායිම්* :

*උතුරට*: ග. පි. අංක 883හි කැබලි අංක 105 හා මෙම පිඹුරේ කැබලි අංක 549; *නැගෙනහිරට*: මෙම පිඹුරේ කැබලි අංක 149; *දකුණට*: අවසාන ගම් පිඹුරු අංක 903 ඇළ ඉහළ ගම; *බටහිරට*: ගම් පිඹුරු අංක 883හි කැබලි අංක 105.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියකියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2016 පෙබරවාරි මස 24 වැනි දින පෙ. ව. 10.00ට කොළොන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2016 පෙබරවාරි මස 17 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

එස්. එම්. ඩී. සී. සමරසේකර,
ප්‍රාදේශීය ලේකම්,
කොළොන්න.

2016 ජනවාරි මස 20 වැනි දින,
කොළොන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

02 - 245

# 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය* : KDS/PJP/04/04/2/W/78.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/9/2014/WS/33.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :*

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලේගම්පහ කෝරළේ සුළු කොට්ඨාසයේ, ගොඩහේන ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් 2015.12.15 දිනැතිව මැන සකස් කරන ලද, අංක මහ 6514 දරන මූලික පිඹුරේ කැබලි අංක 1 වශයෙන් දැක්වෙන "පුස්සහේන වත්ත" නමැති ඉඩමෙන්, මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.0525ක් පමණ වන පහත මායිම් තුළ පිහිටි ඉඩම් කොටස.

**කැබලි අංක 1**

**ඉඩමේ නම: පුස්සහේන වත්ත; හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: එම්. ජී. බන්දුමතී නොහොත් බන්දුමති ගමගේ මහත්මිය, අංක 276, පුස්සහේන වත්ත, දොළපිහිල්ල; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0525**

*මායිම්* :

*උතුරට*: එම්. ජී. බන්දුමති හිමිකම් කියන පුස්සහේන වත්ත; *නැගෙනහිරට*: එම්. ජී. බන්දුමති හිමිකම් කියන පුස්සහේන වත්ත සහ මාර්ගය (ප්‍රාදේශීය සභා); *දකුණට*: මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ එම්. ජී. බන්දුමති හිමිකම් කියන පුස්සහේන වත්ත; *බටහිරට*: එම්. ජී. බන්දුමති හිමිකම් කියන පුස්සහේන වත්ත.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියකියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2016 මාර්තු මස 23 වැනි දින ප. ව. 1.30ට පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2016 මාර්තු මස 16 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

එම්. ඩබ්. එම්. එම්. මඩහපොල,
ප්‍රාදේශීය ලේකම්,
පූජාපිටිය.

2016 ජනවාරි මස 19 වැනි දින,
පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

02 - 246

## ශුද්ධි පත්‍රිකාව

## ඉඩම් අත්පත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*නාගොඩ ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය* : ගානා/4/5/අත්පත්/26.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : L/03/J13/95/HW 405.

ඉහත ශීර්ෂය යටතේ ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* (අති විශෙෂ) අංක 1198/2 දරන 2001 අගෝස්තු මස 20 වැනි දින ඉඩම් අත්පත්කර ගැනීම පිළිබඳ දැන්වීම යටතේ නාගොඩ ප්‍රාදේශීය ලේකම් විසින් ලබා ගැනීමට බලපොරොත්තු වන ඉඩමට අදාළ විස්තර පහත පරිදි සංශෝධනය විය යුතු ය.

**සංශෝධනය**

ගාල්ල දිස්ත්‍රික්කයේ, නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාපලගම ගමේ පිහිටි අ.ග.සි. 526, පත්‍ර 75හි සඳහන් පහත සඳහන් ඉඩම් කැබලි 05.

**කැබලි අංක 2560**
ඉඩමේ නම: තල්ගස්වල වත්ත; විස්තරය: රබර් ඉඩම, අවු. 30ක් වයසැති රබර් ගස්; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0014.

**කැබලි අංක 2561**
ඉඩමේ නම: තල්ගස්වල වත්ත; විස්තරය: විවෘත මුඩුබිම; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0057.

**කැබලි අංක 2562**
ඉඩමේ නම: තල්ගස්වල වත්ත; විස්තරය: ගෙවත්ත, අවු. 10-40ක් වයසැති ඉඹුල් ගස් 4ක් සහ ඇලස්ටෝනියා ගස් 1ක්; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0130.

**කැබලි අංක 2563**
ඉඩමේ නම: තල්ගස්වල වත්ත, ආදර්ශ ගම්මානය; විස්තරය: විවෘත මුඩුබිම; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0101.

**කැබලි අංක 2564**
ඉඩමේ නම: තල්ගස්වල වත්ත, ආදර්ශ ගම්මානය; විස්තරය: තේ ඉඩම, අවු. 10-15ක් වයසැති තේ පඳුරු 80; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0396.

ඉහත සඳහන් ඉඩමට, හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියකියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2016 මාර්තු මස 30 වැනි දින පෙ.ව. 10.00ට නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2016 මාර්තු මස 08 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය. සියලු ඔප්පු තිරප්පු පරීක්ෂණ දිනයේදී ඉදිරිපත් කළ යුතුය.

එස්. නිශාන්ත,
ප්‍රාදේශීය ලේකම්,
නාගොඩ කොට්ඨාසය.

2016 ජනවාරි මස 20 වැනි දින,
නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

02-247